# පරිගණකයෙන් සිංහල අකුරු ලිවීම

- **සම්මත සිංහල යතුරු පුවරුව**

සම්මත සිංහල පරිගණක යතුරු පුවරුව අපට සුපුරුදු විජේසේකර යතුරු පුවරුව අනුව සකසා ඇතත් ලිවීමේ පහසුව තකා සුළු වශයෙන් වෙනස් කර ඇත. මෙම සිංහල යතුරු පුවරු වෙළඳපලෙහි මිලදී ගැනීමට ඇත. එනමුත් සිංහල යතුරු පුවරුවක් නැතිනම් ඉංග්‍රීසි යතුරු පුවරුවකින්ද සිංහල අකුරු ලිවීම කළ හැක. සම්මත සිංහල යතුරු පුවරුවෙහි ආකෘතියක් පහත දැක්වේ.




- **ඔබට පරිගණකයෙන් සිංහල අකුරු ලිවීමට නම්,**

මුලින්ම සිංහල යෙදුම පරිගණකයට ඇතුලත් කර තිබිය යුතුයි. එය ඔබේ පරිගණකය තුල ක්‍රියාකාරී වූ විට 1 රූපය ආකාරයට තත්ත්ව තීරුවෙහි (Status Bar) කළුපාට රවුමකින් පෙන්වන ආකාරයට "ක" මඟින් පෙන්නුම් කළ යුතුයි.




1 රූපය

ඉන්පසු ඔබට ලිවීමට අවශ්‍ය සෑම විටම තත්ව තීරුවෙහි(Status Bar), භාෂා තීරුව (Language Bar) "SI Sinhala (Sri Lanka)" ලෙස 2 රූපය ආකාරයට වෙනස් කර ගතයුතුයි. නැවත ඉංග්‍රීසි අකුරු අවශ්‍ය නම් පෙර ආකාරයටම තත්ව තීරුවෙහි භාෂා තීරුව "EN English (United States)" කර ගත යුතුය. දෙමළ අකුරු සඳහාද එසේමය. යතුරු පුවරුවෙහි වම්පස ඇති Alt හා Shift යන යතුරු එකවර පාවිච්චියෙන් මෙම ක්‍රියාව පහසුවෙන් කර ගත හැක. එලෙස යම් ලිපියක් ලිවීමේදී භාෂා ත්‍රිත්ත්වයම වුවත් උපයෝගී කර ගත හැක.




2 රූපය

- **අකුරු ලිවීම**

❖ සමහර අකුරු තනි යතුරක් මගින් ලිවිය හැකි අතර සමහරක් සඳහා යතුරු කිහිපයකින් ලිවිය යුතුවේ.
❖ යතුරක පහළින් ලියවී ඇති අකුරු සාමාන්‍ය ලෙසද, ඉහළ ඒවා Shift යතුර සමඟද ලිවිය යුතුය.
❖ ඉලක්කම් ආදිය සඳහා සාමාන්‍ය ඉංග්‍රීසි යතුරු පුවරුවේ ඇති යතුරුම ආධාර කරගත යුතුය.
❖ අකුරක් ඉවත් කිරීමේදී සාමාන්‍ය ලෙස Backspace හෝ Delete Key භාවිත කළ යුතුය.

- **පිළි**

| | | | |
|---|---|---|---|
| ඇලපිල්ල (**කා**)=**d** | | කෙටි ඇදය (**කැ**)=**e** | දික් ඇදය (**කෑ**)=**E** |
| ඉස්පිල්ල (**කි,ක්**)=**a** | දීර්ඝ ඉස්පිල්ල (**කී**)=**S** | වක් පාපිල්ල (**කු**) =**q**<br>කොන් පාපිල්ල(**පු**)=**q** | දීර්ඝ පාපිල්ල (**කූ,පූ**) =**Q** |
| කෙටි ගැටපිල්ල (**සෘ**)=**R** | දික් ගැටපිල්ල (**සෲ**)=**RD** | කොම්බුව (**කෙ**)=**f** | කොම්බු දෙක (**කෛ**)=**ff** |
| කොම්බුව හා ඇලපිල්ල (**කො**)=**fd** | කොම්බුව හා දික් ඇලපිල්ල (**කෝ**)=**fd** | කොම්බුව හා ගයනුකිත්ත (**කෞ**) =**fA** | |
| රකාරාංශය (**ක්‍ර**) = ` | රේඵය (**කර්‍ය**) = ~ | යංශය (**ක්‍ය**) = **H** | |
| අනුස්වාරය (**ගං**) =**x** | විසර්ගය (**අඃ**) = **Right** | කණ්ඨජ නාසිකය (**ඞ**) = | |

| | | |
|---|---|---|
| | **Alt+x** | **X** |

- ## බැඳි අකුරු (Conjunct Keys)

ක්‍ෂ, න්‍ද, න්‍ධ යන අකුරු ලිවීම සඳහා අකුරු අතර බැඳීමක් ඇති කළ යුතුය. ඒ සඳහා බැඳි යතුර  (\Join Key) භාවිතා කළ යුතුයි.

උදාඃ 1. න්‍ද = න (k) + බැඳි යතුර ( \) + ද (o) – ( k\o යන යතුරු එකවිට නොවුවත් හැකි ඉක්මනින් ලිවිය යුතුය)

1. රාජපක්‍ෂ = ර (r)+ ා(d) + ජ(c) + ප(m) + ක(l) + බැඳි යතුර(\) + ෂ(I)
2. නන්‍දෝපනන්‍ද = න(k)+ ෙ(f) + න(k) + බැඳියතුර(\) + ද(o) + ා(d) + ්(a) + ප(m) + න(k) + න(k) + බැඳියතුර(\) +ද(o)

- ## නිතර භාවිතා වන විරාම ලකුණු කිහිපයක්

| | | | | | |
|---|---|---|---|---|---|
| කුන්ඩලිය | ෴ | Alt + Ctrl + ' | දෙතිත | : | Shift + ] |
| තිත | . | ' | උඩු කොමාව | ‘ | Z |
| කොමාව | , | Shift + ' | උද්ධෘත කොමාව | “ | Shift + Z |
| තිත් කොමාව | ; | ] | | | |

- ## යතුරු පුවරුවේ නොමැති අකුරු කිහිපයක්

| | | | |
|---|---|---|---|
| ඳ | Right Alt + o | ඞ | Right Alt + v |
| ඟ | Right Alt + . | ඦ | Right Alt + c |
| ඃ | Right Alt + x | | |

(සෑම විටම ඉහත සඳහන් අකුරු භාවිතයේදි දකුණු පස ඇති Alt key (Alt-Gr)  භාවිතා කල යුතුය.)

උදාඃ

1 සිඬාලේප = ස(i) + ි(s) + Right Alt + ඞ(v) + ා(d) + ෙ(f) + ල(,) + ්(a) + ප(m)

- ## විශේෂ අවස්ථා කිහිපයක්

අම්මා = අ(w)+ම(u)+්(a)+ම(u)+ම(u)+ා(d)
කුරුටු=ක(l)+ු(q)+ර(r)+ු(q)+ට(g)+ු(q)

අක්කා= අ(w)+ක(l)+්(a)+ක(l)+ා(d)
ළුණු=ළ(<)+ු(Q) හෝ Shift+J+ණ(K)+ු(q)

ර(r) +ු(q) =රු

ර(r) +ෘ(e) =ෘ

ලංකා = ල(,) + Shift +ං(x) + ්(a) + ක(l) + ා(d)